---

## එරාවූර් පත්තු ප්‍රාදේශීය සභාව

## මඩකලපුව දිස්ත්‍රික්කය

---

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට එරාවූර් පත්තු ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 අනුකූල නොවීම්

විගණනයේදී අනාවරණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති , රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1992 සැප්තැම්බර් 30 දිනැති අංක 1769 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ චක්‍රලේඛය | මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සැලසුම් ඇඳීම් ගාස්තු රු.135,317 ක චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අංක 3.9.1 | රු.6,578,602 ක් වටිනා ප්‍රජා මධ්‍යස්ථාන 11 ක සිවිල් වැඩ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව ප්‍රදානය කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තිය | ගෙවීම් වලින් 5% ක් වූ රඳවා ගැනීම් බදු රු.7,438 ක් අයකර ගෙන නොතිබුණි. |
| (ඇ) | අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව සභාපති විසින් වර්ෂය තුළදී රු.134,284 ක් වටිනා ඉන්ධන ලීටර් 1827 ක් භාවිතා කර තිබුණි. |
| (ඉ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය නොමැතිව වාහනයක් අළුත් වැඩියා කිරීම සඳහා රු.187,508 ක මුදලක් වැයකර තිබුණි. |
| (ඊ) | මුදල් රෙගුලාසි 137 සහ 138 | වගකිව යුතු නිලධාරියෙකුගේ සහතිකයක් නොමැතිව විවිධ කාර්යයන් සඳහා රු.201,690 ක මුදලක් ගෙවා තිබුණි. |
| (උ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තිය | පෙර පාසැල් ළමුන්ගේ විනෝද ගමනක් හා පුද්ගලයකුගේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව රු.13,000 ක මුදලක් ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,454,182 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.2,407,766 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම

සභාපති විසින් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු සභාවේ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) වරිපනම් හා බදු | - | - | 57 | -- | -- | 57 |
| (ii) බදු කුලී | 3,619 | 7,749 | 3,551 | 6,440 | 2,973 | 4,131 |
| (iii) බලපත්‍ර ගාස්තු | 750 | 993 | 134 | 958 | 939 | 244 |
| (iv) වෙනත් ආදායම | 5,774 | 5,778 | 03 | 57,878 | 57,878 | 4 |

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත වියදම, තථ්‍ය වියදම සහ විචලනය පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| <u>පුනරාවර්තන වියදම්</u> | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 3,156 | 13,483 | (10,327) | 10,393 | 12,907 | (2,514) |
| වෙනත් | 18,085 | 15,359 | 2,726 | 9,962 | 9,770 | 192 |
| උප එකතුව | 21,241 | 28,842 | (7,601) | 20,355 | 22,677 | (2,322) |
| මූලධන වියදම | 3,848 | 27,885 | (24,037) | 2,800 | 39,098 | (36,298) |
| මුළු එකතුව | 25,089 | 56,727 | (31,638) | 23,155 | 61,775 | (38,620) |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය

සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | 2010 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | අනුමත | තථ්‍ය |
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | 01 |
| ද්විතීය ශ්‍රේණිය | 18 | 17 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 23 | 21 |
| වෙනත් ( අනියම් / තාවකාලික ) | -- | - |
| | 42 | 39 |

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 අයකරගත යුතු සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 3 ට වැඩි අයකරගත යුතු සේවක ණය ශේෂ එකතුව රු.1,260,687 ක් විය.

### 2.5.2 සමීක්ෂණය නොකළ වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු කර නොගෙන පොත්වල දැක්වෙන ශේෂය මත ගණනය කරන ලද වත්කම්වල වටිනාකම රු.138,735,415 ක් විය.

## 2.6 අභ්‍යන්තර විගණනය

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) අභ්‍යන්තර විගණනය

(ආ) ආදායම් පරිපාලනය